# විපුලි ගුණසේකර සම්මාන ලබයි

මෙල්බන් ශ්‍රී ලාංකික සමාජයේ දරු දැරියනගේ සිංහල භාෂා නිපුනතාව වර්ධනය කරනු වස් මහත් සේවාවක් කරමින් සිටින විපුලි ගුණසේකර මහත්මිය පසුගිය 4 වන දින බොක්සිහිල් නගර ශාලාවේදී පැවැත්වුණ ශ්‍රී ලංකා නිදහස් දින උත්සවයේදී අධ්‍යාපන ක්ෂේත්‍රය වෙනුවෙන් පිරිනැමෙන රමණී ලියනාරච්චි අනුස්මරණ සම්මානයෙන් පුද ලැබුවා ය.



ඇය වසර 2001 සිට රොක්ස්බර්ග් පාක් සිංහල භාෂා පාසලේ ගුරුවරියක ලෙස වීසීඊ විභාගය වෙනුවෙන් සිංහල භාෂාව විෂයයක් ලෙස හදාරන්නට දරු දැරියන් පුහුණු කරමින් සිටියි. සිංහල භාෂා විෂයය සම්බන්ධයෙන් ඇගේ කැපවීම පිළිබිඹු කරමින් ඇගෙන් අධ්‍යාපනය ලද ශිෂ්‍ය ශිෂ්‍යාවන් කීප දෙනෙක්ම වීසීඊ විභාගයෙන් සිංහල භාෂාවට වික්ටෝරියා ප්‍රාන්තයේ වැඩිම ලකුණු ගන්නට සමත් වූහ. සිය දරු දැරියනට අමතර පන්ති පවා පවත්වමින් ඇය කරන කැපවීම සැමගේම පැසසුමට ලක්වෙයි.

2008 වසරේදී වික්ටෝරියා රජයේ වික්ටෝරියා භාෂා ආයතනයේ සමාජ සේවා සම්මානයෙන් ඇය පිදුම් ලැබුවේ ද ඇගේ මේ කැපවීම නිසා ය.

විපුලිට ඇගේ මේ උතුම් සේවාව තවත් ඉදිරියට කරගෙන යන්නට සන්නසෙන් සුබ පැතුම් මෙසේ පිරිනැමෙයි.

## එල් බී ඒකනායක අනුස්මරණ මාධ්‍ය සම්මානය නිමල් ජයලත් ට

1981 දී ඕස්ට්‍රේලියාවට සංක්‍රමණය වූ නිමල් එදා සිටම කරු ලියනාරච්චි මහතා සමගින් 3EA/SBS වැනි ගුවන් විදුලි සේවාවන්ට එක්ව කටයුතු කළේ ය. 3ZZZ ගුවන් විදුලියේ ආරම්භයේ සිටම එහි ක්‍රියාකාරී සාමාජිකයකු වූ නිමල් 2001 වසරේදී එහි සිංහල අංශයේ කැඳවුම් කරු ලෙස නටයුතු කළේ ය. එදා සිට අද දක්වාම 3zzz ගුවන් විදුලියට ඔහුගෙන් ලද දායකත්වය විභාලය.

2005 දී නිමල් ප්ලෙන්ටි වැලි ගුවන් විදුලියේ 88.6FM ලක්මිහිර සේවාව හා සම්බන්ධ වූයේ ය. ඔහු ඉන් අනතුරුව 3WBC 94.1 ගුවන්විදුලියේ අඟහරුවාදා ලක්මිහිර ගුවන්



විදුලි වැඩ සටහනට සම්බන්ධ විය.

නිමල් "චැනල් 31" රූපවාහිනී සේවාවේ ගුඩ් මෝනිං ශ්‍රී ලංකා වැඩ සටහනේ නිවේදකයකු ලෙසද සේවය කරයි. විවිධ කලාකරුවන් කලා කාරියන් සමගින් සංවාද වැඩ සටහන් රැසක් නිමල් චැනල් 31 රූපවාහිණිය වෙනුවෙන් ඉදිරිපත් කළේ ය.

විවිධ සමාජ සේවා කටයුතු වලදීද ඉදිරියෙන් සිටින නිමල් ජයලත් ට සන්නස මෙසේ සුබ පතයි.



## වජිර ඒකනායක ගේ සමාජ සේවාව අගැයෙයි

මෙල්බන් නුවර ශ්‍රී ලංකා සමාජයේ ප්‍රකට සමාජ සේවකයකු වන වජිර ඒකනායක මහතා පසුගිය 4 වන දා බොක්ස්හිල් නගර ශාලාවේදී පැවති නිදහස් උළෙලේ දී නිමල් ද මෙල් අනුස්මරණ සම්මානයෙන් පිදුම් ලැබුවේ ය. ඩැන්ඩිනොන් රතු කුරුස සමාජයේ ක්‍රියාකාරී සාමාජිකයකු වන වජිර එහි සභාපති ලෙසද කටයුතු කර ඇත. දැන් ඔහු එම සමාජයේ ලේකම් ධුරය දරයි.

විවිධ කලාකරුවන් ඔස්ට්‍රේලියාවට ගෙන්වා ප්‍රසංග රැසක් පවත්වා ඇති වජිර මෙල්බන්හි ශ්‍රී ලාංකේය සමාජයට කර ඇති සේවාව සැමගේ පැසසුමට ලක්වෙයි.

## Activities of Colombo University Alumni Association of Victoria

The Colombo University Alumni Association of Victoria donated several books to the Colombo University Library.



They were presented by Dr. Gandara Amarasinghe, Dr. Ruwan Epa and Mrs. Shyamalee De Costa to the Vice Chancellor of University of Colombo, Prof. Kshanika Hirimburegama on 22nd December at the office of the Vice Chancellor. The Heads of Chemistry, Zoology & Botany departments were also present at the donation.

The next activity of the Association is a Family picnic on Sunday the 27th February at Tirhatuan Park, Kriegal Way (off Outlook Drive), Dandenong North (Mel 81 F8) from 10 am to 2 pm. Further information please call Priyantha on 87072329, Senake on 98014356 or email to cuaav2011@gmail.com

## BLOG කතන්දර

### ටැලිගිරැං

අදහස් ප්‍රකාශනය නැත්තං සන්නිවේදනය කියන එක ලේසි පාසු දෙයක් නෙමේ. භාෂාව දැන ගත්තට විතරක් මදි. තමන්ට කියන්න අවශ්‍ය දේ, අහන කෙනාට හරියටම තේරෙන්න නොකිව්වොත් වැඩේ යූස්ලස්. ඊට අමතරව, කටින් කියපු දේවල් නං පස්සෙ වෙලාවක මං එහෙම කිව්වෙ නෑ කියල බේරෙන්න පුළුවනි. රෙකෝඩිං එකක් නැත්තං ෂේප්. හැබැයි පුතෝ ලියපු එකක් නං තමන්ගෙන් මුදා හැරියට පස්සෙ වෙනස් කරන එක බොරු.

ටැලිගිරැං වලින් කරන්නේත් පණිවිඩයක් එක තැනක ඉඳන් තව තැනකට අරින එකනේ.

මේ කතන්දරේ කියවන මොබයිල් ෆෝන්, එස්.එම්.එස්., එම්.එස්.එන්., ගූගල් බස්, ෆෙස් බුක්, ට්විටර් ගැන විතරක් දන්න පොඩි උන් ගේ ප්‍රයෝජනය පිණිස මෙන්න ටැලිගිරැං වලින් පණිවිඩ යවන හැටි කෙටියෙන්.

ඔන්න මහනුවර ඉන්න සෙනෙහෙලතා ට, මාතර ඉන්න සුමනසිරි ට පණිවිඩයක් යවන්න ඕනැ වුණා කියල හිතන්න. සෙනෙහෙලතා තමන් ට ළඟම තියෙන ටෙලිෆෝන් පහසුකම් සහිත තැපැල් කන්තෝරුවට ගිහින් (ඉස්සර කාලේ උප තැපැල් කාර්යාල වල ටෙලිෆෝන් තිබිල නෑ) තමන් ගේ පණිවිඩයයි, සුමනසිරි ගේ ලිපිනයයි ලියල දෙනව. වචන ගානටයි ගාස්තුව.

තැපැල් කන්තෝරුවෙ ක්ලාක් කාරයා ඒ පණිවිඩේ, වචනෙන් වචනේ, ටෙලිෆෝන් එකෙන් කියනවා සුමනසිරි ගේ ගමට ළඟම, ටෙලිෆෝන් තියෙන තැපැල් කන්තෝරුවේ ඉන්න ක්ලාක් ට. පොර ඒක අතින් ලියා ගන්නව. ටැලිගිරැං පණිවිඩවල නොයෙකුත් පටලවිලි වෙන්නේ මෙන්න මේ හුවමාරුවේ දී යි. ඊ ලඟට, ඒ පණිවිඩය තැපැල් කාරයෙක් ලවා සුමනසිරි ගේ ගෙදරට යවනව බයිසිකල් එකේ.

සෙල්ලම්මා ගේ ටැලිගිරැං එක නඩරාජා ට යන්නේත් ඔය විදියටමයි.

අපේ ආච්චිලා ගේ කාලේ නං ටැලිගිරැං යවල තියෙන්නේ ඉංගිරිසියෙන් විතරයි. ඒ කාලේ කෙල්ලන් ට උගන්වන්නේත්, ටැලිගිරැං එකක් කියව ගන්න තරම් දැනුමක් එන්න විතරලු. ඒ දවස්වල පණිවිඩ ටෙලිෆෝන් එකෙන් කියද්දී, විශේෂයෙන් ම නම්, ගම් හරියට ස්පෙල් කරන්න, භාවිතා කරලා තියෙනවා අපූරු සංකේතාවලියක්.

A = ආතර්
B = බොබ්
C = චාලි
D = ඩේවිඩ්
E = එඩ්වඩ්

යනාදී වශයෙන්. උදාහරණයක් ලෙස පෙරේරා කියල කියන්නේ මෙහෙමයි.

පීටර්, එඩ්වඩ්, රොබට්, එඩ්වඩ්, රොබට්, ආතර්.

මං මුලින් කීවනේ සන්නිවේදනය ගැන. දැන් මෙන්න ටැලිගිරැං ගැන අපේ කාලේ කතන්දර දෙකක්.

* * *

මං අර නුවර තිප්පොලේ ඉන්න කාලේ, දවසක් හදිසියේම කැම්පස් එක වැහැව්වා. ඊරියගම බෝඩිමක හිටපු දෙවන වසරේ අපිට ගෙදර යන්න හදිස්සියක් තිබුනේ නෑ. ඉතිං අපි එක්ක හිටපු එකෙක් ගෙදරට ටැලිගිරැං එකක් ගැහැව්වා මෙන්න මෙහෙම.

"විශ්ව විද්‍යාලය වැහැව්වා. මට කරදරයක් නැහැ. පසුව ගෙදර එන්නම්."

කරදරයක් නැති නං ඇයි ටැලිගිරං ගහන්නේ කියලා හිතලා මෙන්න බොලේ පහුවදාම පොර ගේ තාත්තා බෝඩිමට එනවා මහා කලබලෙන්(

* * *

සන්නිවේදනය ගැන හොඳ පාඩමක් එන තව ටැලිගිරැං කතන්දරයක් මෙන්න.

අපේ පොරකට දවසක් ගෙදරින් ටැලිගිරැං එකක් ඇවිල්ලා තිබුණා මෙන්න මෙහෙම.

"නංගී වැඩිවියට පත්වුණා. ගෙදර එන්න එපා."

### කතන්දරකාරයා

**ප/ලි**

මාත් දවසක් පේරාදෙනියේ පෝස්ට් ඔෆීසියෙන් ගෙදරට ටැලිගිරැං එකක් යවලා තියෙනවා.

"දෙවන ඉහල පෙල සාමාර්ථයක් ලැබුණා. දින දෙකකින් ගෙදර එනවා."

මගේ ආදර,ය තාත්තා ගේ එක් සිහිනයක් මං සැබෑවක් කලේ ඒ විදියටයි.

http://kathandara.blogspot.com/